# [12]
# සංගීතය සහ සේවක කාර්යක්ෂමතාව

කේ. ඩී. විජයරත්න, වයි. ටී. ඩී. නදීමා, ටි. එන්. විජේසේකර, එල්. එච්. කසුන් මදුසංක


**හැදින්වීම**

නූතන ශ්‍රී ලාංකේය සමාජ සංදර්භය තුළ මතු නොව සමස්ත ලෝකය  පුරාම, මානව සම්පත අන් සියලු සම්පත් වලට ඉහළින් අගය කෙරෙන යුගයක් විස එක් වන සියවසේ සයිබර් අවකාශය තුළ බිහිවී ඇත. මෙම ප්‍රවණතාවය තුළ මානව සම්පත් කළමනාකරණය හා මානව සම්පත් උපයෝජනය තුළින් වැඩි කාර්යක්ෂමතාවයක් හා ඒ හරහා ආයතනික අරමුණු ඉටු කරගැනීම කෙරෙහි ලොව බොහෝ ව්‍යාපාරික ආයතන නැඹුරුතාවක් දක්වන බව පෙනේ. මෙය හේතු කොට ගෙන පුද්ගල කාර්යක්ෂමතාව වැඩි කිරීමේ සහ එය පවත්වා ගැනීමේ නවමු මං පෙත් විවර වීමට ඉඩ කඩ උද වී ඇත.

මානව ශිෂ්ටාචාරයේ ප්‍රගමනයේ දී මානවයා අත් නොහැර සෙවනැල්ලක් මෙන් සිටියේත්, ඔහුගේ රසාස්වාදනයට  සමගාමීව තර්කන හැකියාව ද දියුණුවට පත් කළේත් සංගීතයයි. විශ්වයේ මුලාරම්භයේ පටන් බොහෝ පදාර්ථ සංයෝජන වීමට ද බොහෝ ක්‍රියාකාරකම් සුමටව සිදුවීමට ද සංගීතය, වඩා නිවැරදිව කිවහොත් රිද්මය බලපා ඇත.

මෙකී රිද්මයට විශ්වීය නාදයන්ගේ ඉමිහිරි රටාවන් සුසංයෝග වීමෙන් සැදෙන සංගීතය අද ජීවයේත්, ප්‍රේමයේත්, මානව දයාවේත් උල්පතක් බවට පත්ව ඇත. මෙකී නිර්මාණයෙන්ගෙන් ඔබ්බට යමින් සංගීතය පුද්ගල කාර්යක්ෂමතාව නංවාලීම උදෙසා යොදා ගැනීම අද සමස්ත ලෝකයාගේ ම අවධානයට පාත්‍ර වන කතිකාවතක් බවට පත්ව තිබේ.

රූප සටහන් අංක 01





මූලාශ්‍රයඃ http://churchmusicblog.files.wordpress.com/2009/11/brain-music.jpg

සංගීතය, මිනිස් මොළයේ ආදානයන් වෙත කෙරෙන බලපෑම සහ ඉන් ඇති වන ප්‍රතික්‍රියා රූප සටහන් අංක 01 මඟින් පෙන්වා දී ඇත. මිනිස් මොළය තුළ සංගීතයේ ක්‍රියාකාරීත්වය

රූප සටහන් අංක 02 මගින් පෙන්වා දෙයි. නමුදු මෙම වාර්තාවේ දී වැඩි අවධානයක් යොමු කෙරෙන්නේ ව්‍යාපාරික ලෝකයේ දී සංගීතය වෙත එල්ල වී ඇති අවධානය, එහි භාවිතය හා වර්තමාන ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම කෙරෙහිය.

රූප සටහන් අංක 02




මූලාශ්‍රය: http://churchmusicblog.files.wordpress.com/2009/11/brain-music.jpg

සමස්තයක් ලෙස ගත්කල ගෝලීය බහුජාතික ආයතන පමණක් නොව, ශ්‍රී ලාංකේය ව්‍යාපාරික ආයතන ද වර්තමානයේ දී සංගීතය සේවක කාර්යක්ෂමතාව නංවාලීමේ මෙවලමක් වශයෙන් යොදා ගෙන ඇත. බැංකු ක්ෂේත්‍රයේ දී හැටන් නැෂනල්, HSBC වැනි බැංකු ද නිෂ්පාදිත හා සේවා ක්ෂේත්‍රයේ දී යුනිලීවර්ස් සහ ජෝන් කීල්ස් වැනි ආයතනද ශ්‍රී ලාංකේය ව්‍යාපාරික වංශ කතාවේ මෙම ක්ෂේත්‍රයේ පුරෝගාමීහු වෙති (HSBC Annual Report 2008, HNB Annual report 2008).

පුද්ගල කාර්යක්ෂමතාව සහ පසුබිම් සංගීතය අතර පැවතිය හැකි සහ සම්බන්ධය පිළිබඳ විශ්ලේෂණයන් සහ පර්යේෂණ රාශියක් ලොව පුරා විශ්ව විද්‍යාල සහ වෙනත් පර්යේෂණ ආයතන මගින් සිදුකර ඇත. සාමාන්‍යයෙන් පසුබිම් සංගීතය නිසා පුද්ගල කාර්‍යයක්ෂමතාව 5% ක් පමණ වැඩි වන බව ලොව පුරා පුද්ගල නියැදි රැසකින් ලබාගත් අගයන්ගේ සාමාන්‍යයෙන් තහවුරු වෙයි. ව්‍යාපාරිකයන් මුහුණ දෙන ප්‍රධානතම අභියෝගය වන්නේ මෙම ක්‍රමයෙන් ආයතනික කාර්‍යයක්ෂමතාව වැඩි කිරීමට උත්සාහ කිරිමේ දී රුචිකත්වයන්හි වෙනස්කම් නිසා ඊට බාධා එල්ල වීමයි (Guness, 1999).

දැනට සිදු කර ඇති සමීක්ෂණ මගින් හෙළි වී ඇති තොරතුරු වලට අනුව සාමාන්‍යයෙන් 20% පමණ සේවක පිරිසක් පසුබිම් සංගීතයෙන් තොර ආයතනික පරිසරයකට කැමැත්තක් දක්වති. මෙය වඩාත් දුරට විශ්ලේෂණය කළ විට මින් 10% පමණ පිරිසකට උපරිම කාර්යක්ෂමතාව සඳහා සම්පූර්ණ නිශ්ශබ්දතාවය අවශ්‍ය වන අතර එය නොමැති වීමේ දී උපයෝගීතාවය අඩු වීමට, නොරිස්සුමට, අපහසුතාවයට සහ කෝපයට ද පත්වීමේ අවකාශයක් පවතී.

රූප සටහන් අංක 03




මූලාශ්‍රයः Guess, T. P. (1999) Work to the music – benefits of music in the workplace – brief article. (Online).

මෙම හේතුන් නිසා ආයතනය වෙත පූර්ණ වශයෙන් සංගීතමය පද්ධතීන් බද්ධ කිරිම පිළිබඳ ගැටලු පැන නැගී ඇත. මීට පිළියමක් වශයෙන් වර්තමානයේ ව්‍යාපාරික ලෝකයාගේ අවධානය යොමුවී ඇති වඩාත් ප්‍රායෝගික සහ පහසුම ක්‍රියාමාර්ගය වන්නේ පුද්ගල ශබ්ද විකාශන පද්ධතීන් වෙන් වෙන්ව ඒ ඒ සේවකයාට ලබා දී සංගීතයේ ස්වාභාවය, ශබ්දය, රිද්මය පාලනය කිරීම, පෞද්ගලිකව ම කිරීමේ පහසුකම් සැලසීමයි (Guess, 1999).


පිරිවැය විශාල ලෙස දැරීමට සිදු වන බවක් පෙන්වා සිටියද නූතන තාක්ෂණික දියුණුව තුළ අධි තාක්ෂණික උපකරණ සඳහා වන ඉල්ලුම වැඩිවෙද්දී, සාමාන්‍යය න්‍යායට පටහැනිව යමින් ඒවායේ සාමාන මිල මට්ටමද පහළ යමින් පවතින නිසා නුදුරු අනාගතයේ දී ම ඕනෑ ම ආයතනයකට දැරිය හැකි පිරිවැයක් යටතේ මෙම සංගීතමය උපකරණ පද්ධතීන් ලබා ගත හැකි වනු ඇති බව විශ්ලේෂකයන්ගේ අදහසයි.

කාර්යක්ෂමතාව සඳහා සංගීතය යොදා ගැනීමේදී පරියේක්ෂකයන්ගේ අවධානය යොමු වී ඇති තවත් එක් වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ රැකියාවේ, රැකියා ස්ථානයේ සහ වගකීම් වල ස්වාභාවය අනුව, යොදා ගත යුතු සංගීතය සහ නාද රටා වෙනස් කළ යුතුද යන්නයි (Guess. 1999). දීර්ඝ සහ සංකීර්ණ පර්යේෂණ රැසකින් පසුව ඔවුන් එළඹ ඇති නිගමනය වන්නේ සාමාන්‍ය, නොවෙනස් එදිනෙදා කාර්ය සාධන මට්ටම සහිත පහළ ස්ථර වල රැකියා සඳහා සංගීතය යොදා ගැනීම මගින් වැඩි ප්‍රතිඵල ලබා දිය හැකි බවයි.

ඔවුන්ගේ මානසික තත්ත්වය ඒකාකාරී බව සහ වෙහෙස මෙම සංගිතමය නාද රටා මගින් යම්තාක් දුරකට සමනය වන බව පුද්ගල අදහස් වලින් මෙන්ම වෛද්‍ය වාර්තා මඟින් ද තහවුරු වී ඇත. එමෙන් ම කර්මාන්ත ශාලා වැනි ස්ථාන සඳහා ජෑස් (Jazz) හාඩ්රොක් (Hard Rock) වැනි සංගීතමය නාද රටා පවා යොදා ගත හැකි බව වර්තමානයේ දී පිළිගැනේ.

මානසික පීඩනය සහිත ව එකිනෙකට වෙනස් කාර්යයන් දිනපතා කිරිමට සිදු වන, මානසික අභියෝගයන් සහිත රැකියාවන් වෙත පසුබිම් සංගීතය මඟින් ඇති කළ හැකි බලපෑම, ඉහත සඳහන් සාමාන්‍ය මට්ටමේ (Operational Level) රැකියාවකට වඩා අඩු බව පර්යේක්ෂකයන්ගේ අදහසයි. ඔවුන්ට සංගීතය වෙත මනස යොමු කිරීමට ඇති අපහසුව මීට හේතු වී ඇත. මන්ද යත් මෙම වාර්තාවේ දී රූප සටහන් මඟින් දක්වා ඇති අන්දමට තර්කානුකූල හැකියාවන් වර්ධනය වන්නේත්, ක්‍රියාත්මක වන්නේත්, සංගීතය රස විඳීමට සහ එය බුද්ධිගෝචර කර ගැනීමට උපකාරී වන්නේත් මොළයේ එකම අර්ධයකින් බැවිනි.

රූප සටහන් අංක 04




මූලාශ්‍රයඃ http://s3.amazonaws.com/readers/2009/04/02/brain2_1.gif

මෙවැනි මට්ටමේ රැකියා වලට පසුබිම් සංගීතය හඳුන්වා දෙතොත් එය සාම්ප්‍රදායික (classic) ගැමි (folk) සහ මෘදු (soft) යන සංගීත සම්ප්‍රදායන්ට සීමා කළ යුතු බව පර්යේෂකයන් පවසයි.

පසුබිම් සංගීතය මගින් අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කර ගැනිමට ද ලොව ප්‍රධාන පෙළේ ආයතනයන් හි අවධානය යොමුව ඇත. කරන ලද පර්යේෂණයන්ගෙන් තහවුරු වී ඇත්තේ සංගීතමය වපසරියක් තුළ අන්තර් පුද්ගල ගැටුම් අවම මට්ටමක පවතින අතර පුද්ගල සබඳතා, අන්තර් පුද්ගල සන්නිවේදනය සහ අවබෝධය අතිශය ඉහළ මට්ටමක පවතින බවය (Roux, 2005).

සේවක ස්මරණය සහ ධාරණ ශක්තිය ඉහළ නැංවීමට ද සංගීතය දායකත්වයක් දක්වයි. සේවක ස්මරණ, ශක්තීන් ස්මරණ ධාරිතාව තීරණාත්මක සාධකයක් බවට පත්වන දත්ත සටහන් සහ විශ්ලේෂණ ව්‍යාපාරික ක්ෂේත්‍රයන් හී ද සේවක කාර්යක්‍ෂමතාව සඳහා නූතනයේ පෞද්ගලික ශ්‍රව්‍ය පද්ධතීන් සේවකයන් වෙත ලබා දී ඇත (Lesiuk, online)

එසේම සේවක අභිප්‍රේරණය සඳහා ද, එකම කාර්යයන් නැවත නැවත කිරිමට සිදු වන කාර්ය පද්ධතීන් හි මානසික වෙහෙස අවම කිරීම සඳහා ද යොදා ගත හැකි ප්‍රශස්ත සහ අඩු පිරිවැය විසඳුමක් ලෙස සංගීතය භාවිතා වේ (Oldham, Greg, 1996).

ඉහත සඳහන් කරන ලද සියලු ම පර්යේෂණ සහ විශ්ලේෂණ වාර්තා මගින් ද, නූතන ව්‍යාපාරික ආයතනයන් හි නවතම ක්‍රියාමාර්ගයන් මගින් ද තහවුරු වන්නේ සංගීතය වර්තමානයේ දී සේවක කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීමෙහි ලා පමණක් නොව වෙනත් විවිධ අංශයන් අතින් ආයතනයට ධන බලපෑම් එල්ල කිරිමෙහිලා ද ප්‍රමුඛස්ථානයක් ගෙන ක්‍රියාකාරන බවයි (Roux, 2005).

1950 දශකයේ දී මුල් වරට සේවක කාර්ය සාධනය කෙරෙහි ඍණ බලපෑම් එල්ල කරන ලදැයි පිළිගැනුන ද සිය සප්ත ස්වර රටා රසික ලෝල හදවත් වලින් ඔබ්බට විහිදුවා ව්‍යාපාරික ලෝකය ද නතු කර ගැනීමට සංගීත විප්ලවය සමත්ව ඇත.

ආර්ථික තරඟයක නොනැවතී යෙදී සිටිනා මානව වර්ගයා යාන්ත්‍රික මිනිසුන් බවට පරිවර්තනය වීමේ විෂම චක්‍රය බිඳ හෙළීමේ දී යෝධ කාර්‍යයභාරයක් සංගීතයට ද පැවරී ඇත.

අනාගතයේ දිනක මෙම ක්‍රියාමාර්ගයට ද වඩා වැඩි වැඩියෙන් සේවක හදවත් වලට සමීප වෙන්නා වූ ද, සේවක කාර්ය රිද්මයන් සමඟ ඒකාත්මික වන්නාවූ ද, අභිප්‍රේරණ වැඩසටහන්

වෙළෙඳපොළට පැමිණෙනු ඇත. එතෙක් අපට ඇති සම්පත් හැකි අයුරින් ප්‍රයෝජනයට ගෙන වරද නිවැරදි කරගනිමින් ඉදිරි ගමනක් යෑම අප සතු යුතුකමකි.

පටු දර්ශනයන්ට ගැති නොවී, ඒවායේ සිර නොවී, ගෝලීය විශ්වීය තලයන්ට ශ්‍රී ලාංකීය ව්‍යාපාරයන් ඔසවා තැබිය යුතු යුගය අද උදා වී ඇත. ඒ සඳහා අනගි සහයක් මෙන්ම අවස්ථාවක් ද අප සතුව ඇත. නව්‍යතා වලින් තොරව ලොව ජය ගැනීමට උත්සාහ කරන්නෝ කිසි කලෙක ධරණීය සංවර්ධනයක් සඳහා නොගියෝ වෙති. වෙනස් වීම ලෝකයේ රීතියයි. එකී වෙනස්කම් සකසමින් ඔප මට්ටම් කරමින් රටට, පරිසරයට, සමාජයට, සංස්කෘතියට උචිත අන්දමින් උපරිම කාර්යක්ෂමතාවයක් උදෙසා යොදා ගැනීම කළමනාකරුවන් සහ නව්‍යතා සම්පාදකයන් වශයෙන් අප සියලු දෙනා සතු යුතුකමක් මෙන් ම වගකීමක් ද වන්නේය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. Lesiuk, Teresa. (online). The effect of music listening on work performance, University of Windsor, Canada, http://pom.sagepub.com/cgi/content/abstract/33/2/173.
2. Greg R. Oldham, Anne Cummings, Leann J. Mischel, James M. Schmidtke, Jing Zhou (1996). HR Magazine, April.
3. HSBC Annual Report: http://www.investis.com/reports/hsbc_ar_2006_en/report.php?type=1
4. HNB Annual Report: http://www.hnb.net/about_annualReports.asp
5. Guness, Terri. P. (1999). Work to the music – benefits of music in the workplace – brief article. : http://www.google.lk/search?hl=en&client=firefox-a&rls=org.mozilla%3Aen-US%3Aofficial&gbv=2&q=guness+1999&meta=&aq=f&aqi=&aql=&oq=&gs_rfai=
6. Roux, Lu. (2005). http://www.myspace.com/larouxuk
7. HR Magazine: http://www.encyclopedia.com/HRMagazine/publications.aspx?date=199604&pageNumber=1
8. Is Music At Work Good For Business?, 23 February 2009, http://www.vodafone.com.au/business/businesssense/strategyandmanagement/musicatwork/index.htm